## 2.2 සංවර්ධන ව්‍යාපෘතීන් සහ බලපෑම් කණ්ඩායම්
## (ශ්‍රී ලංකාවේ නොරොච්චෝලේ තාප විදුලි බලාගාර ව්‍යාපෘතිය ඇසුරෙන්)

ඔසන්ත නයනප්‍රිය තල්පාවිල
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

### ABSRACT

සිවිල් සමාජයේ වර්ධනය වන විවිධ මතවාදයන් බලපෑම් කණ්ඩායම් තුළින් ප්‍රක්ෂේපනයවේ. විවිධ විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන බලපෑම් කණ්ඩායම් සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවලද ක්‍රියාත්මකවේ. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් බලපෑම් කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වය බොහෝ විට දක්නට ලැබේ.

කාර්මික සංවර්ධනය පිලිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී දක්නට ලැබුණු සීඝ්‍ර වර්ධනය හේතුකොට ගෙන බලපෑම් කණ්ඩායම් වල කාර්ය භාරය ද ව්‍යාප්ත වී තිබේ.

රාජ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී බලපෑම් කණ්ඩායම් කවර කාර්යක් ඉටු කරනු ලබයිද යන්න සොයා බැලීම මෙහි අරමුණ වේ. අධ්‍යයනය සඳහා බලපෑම් කණ්ඩායම් වල ක්‍රියාකාරිත්වය පිලිබඳ ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්තද ආධාර කරගනු ලැබිණි.

බලශක්ති නිෂ්පාදනය සම්පාදනයේ ශ්‍රී ලංකාවේ විශේෂ අවධානය 1977න් පසුව ඉහළ ගොස් ඇත. මෑත කාලීනව කාර්මික ක්ෂේත්‍රයේ සිදුවූ උන්නතිය මෙයට බලපා තිබේ. නිෂපාදිත බලශක්ති ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවුණු අතර, ජල විදුලි බලාගාර මගින් විදුලිය ජනනය කිරීමට විශාල පිරිවැයක් දැරිය යුතුවේ.

බලශක්ති නිෂ්පාදනය සඳහා වඩාත් ලාබදායි පිළිවෙතක් වූ ගලු අඟරු තාප බලාගාරයක් පිහිටුවීම සම්බන්ධයෙන් 1978දී ශ්‍රී ලංකා රජයේ අවධානයට යොමු විය. ඒ සඳහා ප්‍රදේශ කිහිපයක්ම යොජනා වූ අතර, අවසානයේ පුත්තලම දිස්ත්‍රික්කයේ නොරොච්චෝල් ප්‍රදේශය තෝරා ගැනුණි.

යෝජිත ගල් අඟුරු තාප බලාගාගාරය ඉදි කිරීම නවතා දමන ලෙස ඉල්ලමින් සිවිල් විරෝධතා ව්‍යාපාර රාශියක් ක්‍රියාත්මක විය. තාප බලාගාරය ඉදිකිරීම නිසා පරිසරයට, භූමියට, කෘෂිකර්මයට, මත්ස්‍ය සම්පතට සහ සෞඛ්‍යයට බරපතල හානි සිදු කෙරෙන බව පෙන්වා දෙමින් විවිධ ක්ෂේත්‍රයන් යටතේ සංවිධානය වූ සමාජ,ආර්ථික ආගමික සංවිධාන 61 පමණ මෙම විරෝධතා ව්‍යාපාරයේ නියැලී සිටිති.

1977න් පසුව බලයට පත් රජයන් විරොධතාවන් හමුවේ ඉදිකිරීම් කටයුත ප්‍රමාද කළහ. 2004 බලයට පත් රජය තාප බලාගාරය ඉදිකිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් විරෝධතාවන්ට ප්‍රතිචාරිව එහි ප්‍රතිලාභ ඉහළ බවත් සිදුවන පරිසර හානිය අවම කර ඇති බවත් සඳහන් කරයි.

රාජ්‍ය සංවර්ධන ව්‍යපෘතීන් සම්බන්ධයෙන් සිවිල් සමාජයෙන් එල්ලවන්නාවූ විරෝධතා පාලනය කිරීම හෝ ඒවා ජයගැනීම ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් ඇති ගැටලුවකි.